DOI: 10.31357/fhssmph.2014.00082

# ශ්‍රී ලංකාවේ බෝරා සංස්කෘතිය

ඩයනා හර්ෂනී විජේසේකර

දර්ශනපති

2014

# ශ්‍රී ලංකාවේ බෝරා සංස්කෘතිය

ඩයනා හර්ෂනී විජේසේකර

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ දර්ශනපති පරීක්ෂණය සඳහා සංස්කෘතික අධ්‍යයනය විෂය යටතේ ඉදිරිපත් කරන නිබන්ධයයි.

# අපේක්ෂකයාගේ ප්‍රකාශය

''මේ නිබන්ධයේ අන්තර්ගතය ආචාර්ය ප්‍රණීත් අබේසුන්දර මහතාගේ සුපරීක්ෂණය යටතේ මා විසින් සම්පාදනය කරන ලද බවත් මේ පර්යේෂණ වාර්තාව කොටස් වශයෙන් හෝ සම්පූර්ණ වශයෙන් හෝ වෙනත් විශ්වවිද්‍යාලයකට හෝ අනික් ආයතනයකට හෝ වෙනත් උපාධියක්/ඩිප්ලෝමාවක් සඳහා ද ඉදිරිපත් නොකරන ලද බවත් සහතික කරමි. ''

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය

ගංගොඩවිල

නුගේගොඩ

**සුපරීක්ෂකගේ සහතිකය**

මේ අපේක්ෂකයා විසින් කරන ලද ප්‍රකාශය සත්‍ය බවත්, මේ නිබන්ධනය ඇගයම් කාර්යය සඳහා විශ්වවිද්‍යාලයට ඉදිරිපත් කිරීමට සුදුසු බවත් නිර්දේශ කරමි./කරමු.

දිනය:- 28-05-2015 ..................

අත්සන

# උපකාරානුස්මෘති

පුළුල් පරාසයක පැතිර තිබූ බෝරා සංස්කෘතියෙන් තොරතුරු බිඳක් ගෙන එම සඳහා මා හට මාර්ගෝපදේශකත්වය සපයමින් නොමඳ සහාය ලබාදුන් මහාචාර්ය බී.එම්. විජේතුංග මහත්මියටත් ආචාර්ය ප්‍රණීත් අබේසුන්දර මහතාටත් මාගේ ඉමහත් ගෞරවය පුදකර සිටිමි.

කුදුමහත් කටයුතු වලදී මෙන්ම මේ කාර්යයේ දී ද නොමඳ දිරියක් පිරිනමමින් කරුණාබරිත හදවතින් මා අවධිකළ පශ්චාද් උපාධි අධ්‍යයන අංශයේ සභාපති මහාචාර්ය සමන්චන්ද්‍ර රණසිංහ ඇදුරුතුමාට මාගේ හෘදයාංගම ස්තුතිය පිරිනමමි.

ගුරුහරුකම් සපයමින් මාහට උපකාර කළ භාෂා හා සංස්කෘතික අධ්‍යයන අංශ ප්‍රධාන ප්‍රදීප් රත්නායක මහත්මාටත්, මුදිත රුවන් අරුමවඩු මහතාටත් මාගේ ස්තුතිය පිරිනමමි.

දුකසැප බෙදාගනිමින් සැම මොහොතකම මාගේ සෙවණැල්ලමෙන් ළඟින් සිටි මාගේ ස්වාමි පුරුෂයාටත් මාගේ දෙමාපියන්ටත් මාගේ සහෝදරියන් දෙදෙනාටත්, පැතුම් මල්ලීටත් හද පිරි ප්‍රණාමය පළකරමි.

සියළු තහංචි පිළිබඳ නොතකා කරුණු සපයාදුන් බෝරා ජාතික ඊබ්‍රාහිම් මූසාජී මහතාටත් හුසේන් මහත්මියටත් හසනලි මහතාටත් සමීර් බායි මහතාටත් තස්නීම් මහත්මියටත් කෘතඥ පූර්වක ස්තුතිය පළකරමි. තොරතුරු සැපයීමේ දී උදවු ලබාදුන් එල්.ඒ.එස්.පෙරේරා, එම්.එස්.සුන්දරාජ්, ෂම්ෂුදීම්, සරත් යන මහත්වරුන්ටත් ඉමහත් ප්‍රසාදය පළකරමි. නන් අයුරින් සහයෝගය දුන් ඔබසැමට මාගේ හදපිරි ස්තුතිය පුදමි.

ඩී.එච්. විජේසේකර

# පටුන

## 1. පළමු පරිච්ඡේදය


1.1 හැඳින්වීම 01-09

1.2 අධ්‍යයනයේ වැදගත්කම 09-11

1.3 පර්යේෂණ ගැටලුව 11-13

1.4 අධ්‍යයනයේ අරමුණු 13

1.5 ක්‍රමවේදය 13-19

1.5.1 මූලාශ්‍ර භාවිතය

1.5.2 නියැදිය

1.5.3 දත්ත විශ්ලේෂණය

1.6 පර්යේෂණ සීමා හා ගැටලු 19-21

1.7 නිබන්ධයේ ආකෘතිය 21-22


## 2. දෙවන පරිච්ඡේදය


ශ්‍රී ලංකාවේ බෝරා සංස්කෘතිය හා එහි ඉතිහාසය 23-49

2.1 බෝරාවරු කවුරුන්ද? 23-35

2.1.1 දාවුදි බෝරාවරු

2.1.2 ශ්‍රී ලංකාවේ බෝරාවරු

2.2 බෝරා පෙළපත 36-40

2.3 බෝරාවරුන්ගේ ලංකාගමනය හා වෙළෙඳ ව්‍යාප්තිය 41-45

2.4 බෝරාවරුන්ගේ අනන්‍යතාව 46-49


## 3. තෙවන පරිච්ඡේදය


ශ්‍රී ලංකාවේ බෝරා සංස්කතිය හා ඔවුන්ගේ ව්‍යාප්තිය 50-84

3.1 බෝරාවරුන්ගේ ආර්ථික, සමාජයීය හා සංස්කෘතික පරිසරය 50-63

3.1.1 බෝරා නාම

3.1.2 බෝරාවරුන්ගේ ඥාතීත්වය උරුම කරන නාම

3.1.3 සම්ප්‍රදායික බෝරා මුළුතැන්ගෙය

3.2 බෝරාවරුන්ගේ සංවිධානාත්මක සමාජ සංස්කෘතිය 64-76

3.2.1 භාෂාව

3.2.2 ඇඳුම් පැළඳුම්

3.2.3 දින දර්ශනය

3.3 නව ලෝකයේ බෝරාවරුන්ගේ ව්‍යාප්තිය, සමාජ සංස්කෘතික වෙනස්වීම් හා ජීවන රටාව 77-84

3.3.1 බෝරාවරුන්ගේ මෙරට හැසිරීමේ විශේෂ මංසළකුණු

3.2.2 බෝරාවරුන්ගේ සළකුණු සහිත මහා මන්දිර

3.2.2 මානව හිතවාදී බෝරා ජාතිකයා

## 4. සිව්වන පරිච්ඡේදය

බෝරාවරුන්ගේ ද්වාර කර්ම චාරිත්‍ර 85-105

4.1 උපත 85-87

4.2 වැඩිවිය පැමිණීම හා මිසාක් චාරිත්‍රය 88-89

4.3 බෝරි විවාහය 90-98

4.4 බෝරා අවමංගල කටයුතු 99-105

## 5. පස්වන පරිච්ඡේදය

බෝරා පල්ලිය හා ආගමික නායකයින් 106-133

5.1 බෝරා පල්ලිය 106-109

5.2 බෝරා සමාජයේ යාඥාව හා ඇදහිලි විශ්වාස 110-124

5.2.1 බෝරා ජනශ්‍රැතිය

5.3 බෝරා සමාජයේ දායි පදවිය 125-133

5.3.1 දායි පදවිය ක්‍රියාත්මකවීමේ ඉතිහාසය

5.3.2 මුදුන්මල්කඩ බඳු දායිවරුන්ගේ සේවය

5.3.2.1 දායිවරුන්ගේ ජීවමාන නායකත්වය හා 53 වෙනි දායි නායකත්වය

5.3.2.2 වර්තමාන දායිවරයාට හිමිතැන

5.3.2.3 දායිවරුන්ගේ ලංකාගමනය

## 6. හයවන පරිච්ඡේදය

බෝරා සංස්කෘතිය හා ආගමික සිරිත් විරිත් 134-172

6.1 බෝරා ජන ජීවිතය 134-154

6.1.1 බෝරාවරුන්ගේ ඇවතුම් පැවතුම් හා සිරිත් විරිත්

6.1.2 බෝරා කාන්තාව

6.1.3 බෝරාවරුන්ගේ සාමාජීය හා ආගමික උත්සව

6.2 බෝරා සංස්කෘතියේ ආගම හා බැඳි කලාව 155-162

6.2.1 මාතම් ශෛලියෙන් ඉස්මතුවන සංගීතය

6.2.2 වාස්තු විද්‍යාවේ උපයෝගීතාව

6.2.3 අක්ෂර කලාව

6.3 බෝරා සංස්කෘතිය නවීකරණය වීම 163-172

6.3.1 මෙරට බෝරාවරුන්ගේ අධ්‍යාපනික පසුබිම

6.3.2 ආර්ථිකයේ විශේෂ සලකුණු

6.3.3 බෝරා සමාජයේ සංස්කෘතික වෙනස්වීම.

## 7. පරිසමාප්තිය

173-176

**8. ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය** 177-184

**9. උපග්‍රන්ථය** 185-210

4.2 මිසාක් ප්‍රතිඥාව

4.2 බෝරා යාඥාවේ කොටසක්

**10. ඡායාරූප පටුන** 211-217

i. ගාල්ලේ පැරණි බෝරා නිවාසය 211

ii. ගාල්ලේ බෝරා පල්ලිය භාරව ඇති වෙළෙඳසැල

iii. බෝරා සමාජයට අයත් පාසල

iv. ශ්‍රී ලංකාවේ බෝරා ලාංඡනය

v. තාල් චාරිත්‍ර අනුගමනය කරමින් ආහාර ගන්නා බෝරාවරු 212

vi. ටෝපි හිස් පළඳනාව

vii. රිදාව ඇඳි බෝරා කාන්තාවන් සහ කුර්තාව ඇඳි බෝරා පිරිමින්

viii. බෝරාවරු ආගම ඇදහීමේදී භාවිත කරන ඇතිරිල්ල

ix. බෝරා මනාලයා

x. බෝරා මනාලිය

xi. බෝරා දින දර්ශනය 213

xii. තාල් භාජනය රඳවන තරක්තිය

xiii. අතීතයේ ලක්ෂ්මිගිරිය නම් වූ සායිෆි විලා

xiv. සායිෆිවිලා දොරටුව

xv. බෝරා සුසාන භූමිය

xvi. සුසාන භූමියේ දොරටුව අසල පිහිටි සුසාන

xvii. බෝරා සුසානභූමි උද්‍යානය 214

xviii. සුසානභූමි පිවිසුම් මාර්ගය

xix. වසරක් ගතවීමට ආසන්න සුසානයක්

| | | |
|---|---|---|
| xx. | මැතක දී කළ භූමදානයක් | |
| xxi. | හිස් අවකාශය සහිත පල්ලි මධ්‍යය | |
| xxii. | සුදු රෙදි එල්ලා ඇති පල්ලියේ දෙවන මහල | |
| xxiii. | පල්ලියේ භාවිත කරන පාවහන් යුගල | 215 |
| xxiv. | ගාල්ලේ බෝරා පල්ලිය | |
| xxv. | පිටකොටුවේ බෝරා පල්ලිය | |
| xxvi. | බම්බලපිටියේ බෝරා පල්ලිය | |
| xxvii. | ජීවමාන දායිවරයාගේ නිල රථය | |
| xxviii. | ජීවමාන දායිවරයා | |
| xxix. | 53 වෙනි දායි නායකත්වයට නම්කළ මුෆාද්දල් පූජකවරයා | 216 |
| xxx. | බෝරාවරු අවමංගල අවස්ථාවල සකසන සර්දෝ ආහාරය | |
| xxxi. | පල්ලියේ උඩුමහලේ සිටින බෝරා කාන්තාවෝ | |
| xxxii. | වෛවර්ණයෙන් යුතු බෝරා කාන්තාවෝ | |
| xxxiii. | බෝරා කාන්තාව තාල් චාරිත්‍රය අනුගමනය කිරීම | |
| xxxiv. | ගාල්ලේ බෝරා පල්ලියේ ඇති මිනාරා කුළුණු | |
| xxxv. | බුරානියා පාසල | 217 |
| xxxvi. | බෝරාවරුන් සතු රස්කිත් දිවයින | |
| xxxvii. | ජීවමාන නායකයාගේ වෙන්වීම | |

# සංක්ෂිප්තය

ඓතිහාසික වශයෙන් කාලිෆ් තනතුර සඳහා වූ මතභේද හේතුකොටගෙන ඉස්ලාම් සමාජය සුන්නි හා ෂියා යන දෙකොට්ඨාසයට බෙදී වෙන්වී ගියේය. බෝරාවරු පැවත එන්නේ ෂියා පාර්ශවයෙනි. ලොවපුරා වාසය කරන බෝරා ජනතාව මිලියන 1.3 ක් පමණ වෙති. ඔවුන්ගේ වාසභූමි ලෙස සැලකෙන්නේ උතුරු ඉන්දියාවේ ගුජරාති ප්‍රාන්තයයි. 13 වන සියවසේදී යෙමනය, ඊජිප්තුව ආදී රටවලින් පැමිණි ෂියා නිකායික මුස්ලිම්වරු හින්දු ආගමික ඉන්දියානුවන් සමඟ මුසුවීම හේතුවෙන් බෝරා මානව කොට්ඨාසය නිර්මාණය විය.

බෝරා ජනතාවගෙන් මෙරට ජීවත්වන්නේ දාවුදි බෝරා පිරිසයි. ''බෝරා'' යන්නෙන් ''වෙළෙඳාම'' යන්න අරුත් ගැන්වේ. එය ගුජරාති බසෙහි ''වොහොරා'' යන්නෙන් බිඳී පැමිණියකි.

පාකිස්තානය, ඉන්දියාව, අරාබිය, ඉරානය, ශ්‍රී ලංකාව ආදී රටවල ඔවුහු සිය නිජබිම් පිහිටුවාගෙන වාසය කරති. බෝරාවරුන්ගේ අද්විතීය භාෂාව දවාත් නී සබාන් (Dawat ni Zaban) වේ. එය ලොව වෙනත් කිසිදු ජාතියකට සුවිශේෂී නොවූ බෝරාවරු අතර පමණක් ව්‍යවහාර වන භාෂාවකි.

බෝරාවරුන්ගේ ජීවමාන ආගමික නායකයා මහා ස්වාමීන් වහන්සේ අරුත් ඇති සෙයියද්නා නම් වේ. වර්තමානයේ බෝරා සමාජයේ පාලනය ගෙනයනු ලබන්නේ 52 වෙනි දායි අල් මුලාක්, ආචාර්ය සයියද්නා මොහම්මද් බුර්හනුද්දීන් පූජකතුමා විසිනි. බෝරාවරු ඔහු අමතන්නේ ''මෝලා'' යන නාමයෙනි. මේ සමාජය ක්‍රියාත්මක වන්නේ ''මෝලා'' වටා සැකසුණු සමාජ ව්‍යුහයකිනි.

බෝරාවරුන්ගේ ආහාරය හලාල් වේ. හරාම් යනු ආහාරයට නුසුදුසු දේය. ඔවුන්ගේ ඇඳුම ලිබාස් අත් අන්වාර් නම්වේ. බෝරි පිරිමින්ගේ ''ටෝපි'' හිස් පළඳනාවත් බෝරි කාන්තාවන්ගේ ''රිදාවත්'' මේ සමාජයේ සුවිශේෂී අංගයන්ය.

ශ්‍රී ලංකාවට බෝරාවරුන්ගේ සම්ප්‍රාප්තිය සනිටුහන් වන්නේ 1830 වර්ෂයේ දීය. මෙරට පැමිණි ප්‍රථම බෝරා ජාතිකයා ජැෆර්ජී ඊසාජීය. ගාල්ල, පිටකොටුව, යාපනය හා බම්බලපිටිය යන ස්ථානයන්හි බෝරා මස්ජිද හතරක් ඔවුන් වෙනුවෙන් පිහිටුවා තිබේ. මස්ජිදය තුළට කාන්තාවන්ට ප්‍රවේශවීමට ඇති හැකියාව නිසා බෝරා සමාජය විශේෂ ජනකොටසකි. ඔවුන්ගේ සාක්‍ෂරතාව ඉතා ඉහළ මට්ටමක පවතී. ලෝකයේ ඉතා ධනවත් පිරිසක් ලෙස සැලකෙන බෝරාවරු මනා සංවිධානයක් සහිත කොට්ඨාසයකි. මොවුන්ගේ සමාජයේ දියුණුවේ රහස දැඩි ආගමික විනය මෙන්ම මත්පැන් භාවිතයෙන් තොරවීමයි.

# පරිච්ඡේදය

# 1

## 1.1 හැඳින්වීම

දියුණුවන ලෝකයේ සෑම දෙයක් දෙසම විවේචනාත්මක හා විමසිලිමත් ඇසින් බැලීම ප්‍රගතියේ ලක්ෂණයකි. පිළිගත් සිද්ධාන්ත බිඳ හෙළමින් අලුත් පර්යේෂණ, නව නිෂ්පාදන ඇතිවන්නේ විවේචනය හා විමසිල්ල නිසාම ය. 'බෝරා සංස්කෘතිය පිළිබඳ අධ්‍යයනය' සංකීර්ණ එමෙන්ම ගැටලු සහිත එකකි. වැඩිමනක්දෙනා පිළිගත් මතය වන්නේ ඉස්ලාමය ඒකමතික ආගමක් වන බවයි. ඉස්ලාම් ආගම පිළිබඳ කතාකරන, ලියා දක්වන බොහෝදෙනා ඉන් හුවා දක්වන කරුණු අනුව එවැනි නිගමනයකට බැස සිටිනු පිළිගත හැකි කරුණකි. ඒ පිළිබඳ විමසිලිමත් ඇසින් බැලූ කල පෙනීයන්නේ ඉස්ලාම් ධර්මයෙන් පිටතට ගිය වෙනත් සංස්කෘති බිහිවී පවත්නා බවකි. සංස්කෘතියක් නිර්මාණය වීමේදී ජාති, ආගම් හා දේශපාලන හේතූන් මූලික විය හැකි අතර රටකට සමාජයකට පොදු වූ මහා සංස්කෘතියට අනුකූල සුවිශේෂී ලක්ෂණ කිහිපයකින් පමණක් වෙනස්වන කණ්ඩායමක් තුළ උප සංස්කෘතියක් පැවතිය හැකිය.

යම් සමාජයක පවත්නා සමස්ත ජීවන රටාව සංස්කෘතියයි. ජීවත්වන රටාව ගොඩනැගෙන්නේ සමාජ සමූහවල අන්තර් ක්‍රියාකාරිත්ව තුළිනි. මෙම ජීවත්වන මෝස්තරය සැමතැන එක හා සමාන නොවේ. එම රටාව ගොඩනැගීම කෙරෙහි භෞතික පරිසරය මෙන් ම සමාජ පරිසරය යන සාධක දායකත්වය සපයන්නේය. ඒ නිසාම ප්‍රාදේශීයව, රටින් රටට සංස්කෘතිය වෙනස් වියහැකිය. සංස්කෘතිය ගොඩනැගීම උදෙසා රටක ජීවත්වන ජනයාගේ දැනුම, ඇදහිලි, විශ්වාස මෙන්ම සිරිත් විරිත් ආදිය ද බලපාන්නේ ය.

''සංස්කෘතිය යනු යම් රටක දැනුම, ඇදහිලි, විශ්වාස, නීතිරීති, කලා ශිල්ප, සාරධර්ම, සිරිත්-විරිත් ආදියෙහි එකතුවකි යනුවෙන් E.B. Tylor සිය Primitive Culture කෘතියෙහි දක්වා තිබේ.'' (1871: 1)

සංස්කෘතිය ගතික ස්වභාවයකින් යුක්ත වේ. එනම් වෙනස්වන ස්වරූපයකින් යුක්ත වීමයි. එබැවින් පැරණි සංස්කෘතිය පමණක් සමාජ සංස්කෘතියක් ලෙස සැලකීම නිවැරදි වුවක් නොවේ. සංස්කෘතියේ සංක්‍රමණික හෙවත් එහාමෙහා ගමන් කරන ස්වභාවය නිසාම එක් එක් සංස්කෘති මිශ්‍රවන ස්වරූපයක් පැවතිය හැකිය.

ඉපැරණි ඉස්ලාම් සංස්කෘතිය සමස්ත මුස්ලිම් ආගම නියෝජනය කරන සමාජ සංස්කෘතියක් යැයි කීම නිවැරදි නොවන්නේ මේ හේතුවෙනි. ''බෝරා සංස්කෘතිය'' ලෙස නම් කිරීමේ දී එහි ඇතුළත් වන්නේ සමස්ත ඉස්ලාම් දහම පමණක් නොවේ. ඒ තුළ පවතින්නේ ඉස්ලාම් පරිසරයේ ස්වභාවයෙන් ලැබුණුදේට අමතරව මිනිසා විසින් ගොඩනඟා ගන්නාලද හා නිර්මාණය කරගන්නා ලද දෑ ය. එම නිර්මාණාත්මක ස්වරූපය නිසා බෝරා සංස්කෘතියේ අන්තර්ගත වී පවතින්නේ අද්‍රව්‍යමය හෙවත් අභෞතික සංස්කෘතියක් යැයි කීම යුක්ති සහගත ය. ඒ තුළ ඔවුන් නිර්මාණය කර ගත් බොහෝ මානසික දෑ අඩංගු ව පවතින්නේ යැයි කිවහැකිය. සිතුම් පැතුම්, සිරිත් විරිත්, ගුණධර්ම, විශ්වාස ආදී සියල්ල ඔවුන් කාලයක සිට නිර්මාණය කරගත් ඒවා බැව් බෝරා සමාජයේ ඉතිහාසය පිළිබඳ සොයා බැලීමේ දී කරුණු හමු වේ.

ආර්ථික ක්‍රියාදාමයන්ට දායක වූ බෝරාවරුන්ගේ අමුතු හැසිරීම පිළිබඳ සොයා බැලීමේ කුතුහලය ඇතිවූයේ අද ඊයේ නොවේ. එකම ස්ථානයක දී හමුවන මෙරට මුස්ලිම් ජාතිකයෙක් හා බෝරා ජාතිකයෙක් කිසිදා නොහඳුනන අය සේ එකිනෙකා අතර ප්‍රතිචාරයකින් තොරව සිටීම පිළිබඳ ලත් අත්දැකීමෙන් උපන් සැකය මෙම පර්යේෂණයට මුලබීජය වුවා යැයි කිවහොත් නිවැරදිය. එකම ඉස්ලාම් ධර්මය අනුගමනය කළ ද ඔවුනොවුන්ගේ යම් යම් අසමානතා පවතින බව හැඟීයන්නේ ඒ පිළිබඳ ගැඹුරු අධ්‍යයනයක යෙදීමෙනි.

මිලයනයකට වඩා බෝරා ජනගහනයක් ලොව පුරා ව්‍යාප්තව පැවතීම නිසා එහි වපසරිය සීමා කරනු වස් මෙරට ජීවත් වන බෝරා ජනතාවගේ සංස්කෘතිය පිළිබඳ පමණක් හැදෑරීම අපේක්ෂාවෙන් ''ශ්‍රී ංකාවේ බෝරා මුස්ලිම් සංස්කෘතිය'' යනුවෙන් මාතෘකාව සකසා ගන්නා ලදී. එයින් අනාවරණය වූ ඇතැම් කරුණු මත බෝරා සමාජය ඉස්ලාම් ධර්මයෙන් හා

ඉන් ඔබ්බට ගිය ඇදහිලි විශ්වාස හා සිරිත් විරිත් සමූහයකින් සමන්විත කොටසක් වශයෙන් සැලකිය හැකි තොරතුරු පෙළගැස්විණ. පර්යේෂණ නිබන්ධයට අදාල සම්මන්ත්‍රණයේ දී ශ්‍රී ලංකාවේ බෝරා මුස්ලිම් සංස්කෘතිය යන මාතෘකාව අධීක්ෂක මෙහෙයවීම මත ශ්‍රී ලංකාවේ බෝරා සංස්කෘතිය යනුවෙන් සංශෝධනය කර ගැනීමට සිදුවිය.

බෝරා ජනතාව පිළිබඳ සිදුවී ඇති අධ්‍යයනයන් ඇත්තේ ඉතා අල්ප වශයෙනි. ''ශ්‍රී ලංකාවේ බෝරා සංස්කෘතිය'' යන මාතෘකාවට අදාළ ව පරිපූර්ණ පූර්ව පර්යේෂණයක් මෙතෙක් සිදුවී නොමැති බව අවධාරණය විය. දෙස් විදෙස් විද්වතුන් විසින් මෙම බෝරාවරු පිළිබඳ පර්යේෂණ ක්ෂේත්‍රයට අදාළ ග්‍රන්ථ හා ශාස්ත්‍රීය ලිපි සීමිත සංඛ්‍යාවක් ප්‍රකාශයට පත්කොට ඇතත් ඒවා තත් විෂය ක්ෂේත්‍රය සම්බන්ධ ශ්‍රී ලංකාවේ බෝරාවරු පිළිබඳ පුළුල් පර්යේෂණයන් ලෙස සැලකිය නොහැකිය.

බෝරාවරු පිළිබඳ සැලකිය යුතු අධ්‍යයනයක් හමුවන්නේ Ashgarali Engineer විසින් රචිත The Bohras (ද බෝරාස්) නම් කෘතියෙහිය. එහි සාකච්ඡා වී පවතින්නේ ඉන්දියාව ප්‍රමුඛ ලොව පුරා විසිරුණු බෝරාවරු පිළිබඳ වුවත් මෙරට තොරතුරු ඉන් මතු නොවේ. සංස්කෘතික චාරිත්‍ර වාරිත්‍ර හා ගති පැවතුම් අතින් කුමන රටක ජීවත් වුව ද බෝරා සමාජයේ තොරතුරු එක හා සමාන බවක් පැවතියත් ඔවුන්ගේ මෙරට සංස්කෘතියේ හැසිරීම් රටාවේ විශේෂතා පිළිබිඹු වීමත් පෙනෙන්නට නැත. බෝරා සමාජයේ තොරතුරු එක සමාන අයුරින් පැවතිය ද ඔවුන්ගේ මෙරට හැසිරීම් රටාවේ විශේෂතා පිළිබිඹු වීමක් නොවේ.

බෝරාවරු පිළිබඳ මෙරට අධ්‍යයනය සිදුකළ මූලාශ්‍ර හමුවන්නේ අතේ ඇඟිලි ගණනටත් වඩා අඩු ප්‍රමාණයකි. නුවන් ගන්කන්දගේ 'අපි නොදන්නා ලාංකිකයෝ' කෘතිය සඳහා පාදක වී ඇත්තේ බෝරා සමාජයයි. A.M.A. Shukri විසින් රචිත Muslims of Sri Lanka කෘතියෙහි මෙරට බෝරා සමාජය පිළිබඳ සැලකියයුතු විස්තර සපයා තිබේ. ඒ හැරෙන්නට කිහිප වතාවක දී පළවූ පුවත්පත් ලිපි මගින් ඔවුන් පිළිබඳ සංක්ෂිප්ත විස්තරයක් ඇතුළත් කර තිබේ.